සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2007

# පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2007 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

* ඔබේ විභාග අංකය පහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

* තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.

විභාග අංකය ........................................

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

* අංක 1 සිට 33 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

* අංක 34 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.


* කටුවැඩ සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

[ 2 වැනි පිටුව බලන්න.

✽ අංක 1 සිට 33 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.


● අංක 1 සහ 2 ප්‍රශ්නවල නොගැළපෙන රූපය තෝරන්න.

1.




(1) (2) (3)


2.



(1) (2) (3)


3. මෙම රූපයේ හිස්තැන සඳහා ගැළපෙන කොටස කුමක් ද?





(1) (2) (3)

4. පහත රූපවල ඇති ලාම්පු බලන්න.




A B C D

කිසියම් ලක්ෂණයක් මත මේ ලාම්පු තැබිය හැකි අනුපිළිවෙළ කුමක් ද?

(1) C, A, D, B (2) B, A, D, C (3) D, C, B, A

5. පහත ඇත්තේ කැඩුණු රූලක කොටස් 4 කි.




1 2 3 4

රූල සෑදීම සඳහා මෙම කොටස් නිවැරදි ව ගැළපිය යුතු ආකාරය කුමක් ද?.

(1) 4, 3, 1, 2 (2) 1, 3, 2, 4 (3) 4, 3, 2, 1

[ 3 වැනි පිටුව බලන්න.

6. පහත රූපවලින් දක්වා ඇත්තේ බිඳුණු බෝතල් කැබලි කිහිපයකි.




නිවැරදි ව බෝතලයක් සෑදීමට ගැළපිය හැකි කැබලි තුන මොනවා ද?

(1) 1, 3, 4 (2) 6, 3, 2 (3) 1, 2, 5

● අංක 7 සහ 8 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.


7. ධීවරයාට මුහුද මෙන් ක්‍රීඩකයාට ............... (1) පිට්ටනිය (2) බෝලය (3) පිත්ත


8. ගුරුවරයාට ශිෂ්‍යයා මෙන් වෛද්‍යවරයාට ........... (1) මහජනයා (2) රෝගියා (3) හෙදිය

9. පාත්ති 5 ක එළවලු හා මල් වවා ඇත්තේ, එක් පාත්තියක එක් වර්ගයක් පමණක් වන සේ ය. මල් වවා ඇති පාත්ති ගණන දෙකකි. එළවලු හා මල් වවා තිබිය හැකි ආකාරය කුමක් ද?

(1) රෝස කපුරු රාබු බෝංචි ගෝවා
(2) රෝස කපුරු ඇන්තූරියම් රාබු බෝංචි
(3) රෝස රාබු බෝංචි ගෝවා කැරට්



● පහත කොටුව තුළ දී ඇති තොරතුරු ඇසුරෙන් අංක 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.




10.  සමාන වනුයේ කුමකට ද?

(1) 800 ml (2) 1000 ml (3) 1600 ml

11. වඩාත් නිවැරදි සම්බන්ධය කුමක් ද?

(1)  (2) 

(3) 

12. පාරේ තිබූ විදුලි පහන් කණු දෙකක් අතර කොඩි 2 ක් බැගින් එල්ලා පාරක් සැරසීමට තීරණය කරන ලදී. පාරේ විදුලි පහන් කණු 8 ක් තිබුණේ නම් ඒ අතර එල්ලීමට කොඩි කීයක් අවශ්‍ය ද?

(1) කොඩි 14 කි. (2) කොඩි 16 කි. (3) කොඩි 18 කි.

[ 4 වැනි පිටුව බලන්න.

13. බසයක සිටින පිරිමි මගීන් සංඛ්‍යාව, එහි සිටින ගැහැනු මගීන් සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වේ. තවත් ගැහැනු 4 දෙනකු බසයට නැගුණහොත්, බසයේ සිටින පිරිමි සංඛ්‍යාව සහ ගැහැනු සංඛ්‍යාව සමාන වේ. එවිට බස් රථයේ සිටින මුළු මගීන් සංඛ්‍යාව කීය ද?
(1) 8 (2) 12 (3) 32

14. 2007 වර්ෂයට දින 365 ක් ද, 2008 වර්ෂයට දින 366 ක් ද ඇත. 2007 වර්ෂයේ ජනවාරි 01 දින සඳුදාවකි. 2008 වර්ෂයේ ජනවාරි 01 දින අඟහරුවාදාවකි. ඒ අනුව 2009 ජනවාරි 01 දින
(1) සඳුදාවකි. (2) බදාදාවකි. (3) බ්‍රහස්පතින්දාවකි.

15. ඉරිදා දින පහකින් යුත් අප්‍රේල් මාසයක, එම ඉරිදා දිනවල එකතුවට තිබිය හැකි වැඩිම අගය වන්නේ
(1) 75 කි. (2) 80 කි. (3) 85 කි.

16. මුහුදේ නිතර ම ඇත්තේ
(1) රළ සහ මාළු ය.
(2) මාළු සහ ජලය ය.
(3) ජලය සහ ලුණු රස ය.

17. වචනයක නිතර ම ඇත්තේ
(1) අකුරු හා අර්ථය ය.
(2) අර්ථය හා මුද්‍රණ වැරදි ය.
(3) ඉස්පිළි හා පාපිලි ය.

18. සඳ පායා නොමැති දිනක මධ්‍යම රාත්‍රියේ ගෙයින් පිට වී අවුත් අහස දෙස බැලූ විට ඈත අහසේ පියාඹා ගිය ගිරව් රැනක් දැකගත හැකි වූ බව සරත් කියයි. මෙය සිදුවිය නොහැකි ය. එයට හේතුව
(1) අඳුරේ එවැන්නක් පෙනීමට නුපුළුවන් හෙයිනි.
(2) රෑට පියාඹන්නට ගිරවුන්ට අවශ්‍ය කමක් නැති නිසා ය.
(3) ගිරවුන් රංචු වශයෙන් පියාඹන්නේ නැති නිසා ය.

19. සෝමරත්නගේ එක ම දරුවා වූ සුනිල් පාසලට ප්‍රමාද වී පැමිණ කියා සිටියේ, මල්ලී සමඟ කඩයට ගොස් එන්නට ගිය නිසා ප්‍රමාද වූ බව ය. මෙය සත්‍යයක් විය හැකි ය. එයට හේතුව
(1) සුනිල් ඇවිදීමට ලැදි කෙනකු නිසා ය.
(2) සුනිල්ට සහෝදර සහෝදරියන් කිහිපදෙනකු සිටින නිසා ය.
(3) සුනිල්ගේ බාප්පාගේ පුතකු ද වාසය කරන්නේ සුනිල්ගේ ගෙදර නිසා ය.

- **අංක 20 සහ 21 ප්‍රශ්නවල, මුලින් දී ඇති ප්‍රකාශය පිළිබඳ නිවැරදි නිගමනය තෝරන්න.**

20. පාසල් සේවා බස්රථ වේලාව නොවරදවා පාසල් වෙත ළඟාවෙයි.
(1) මෙය බොහෝ විට සිදුවන්නකි.
(2) මෙය කිසිවිටෙකත් සිදු නොවන්නකි.
(3) මෙය සැමවිට ම සිදුවන්නකි.

21. උත්සාහ කළහොත් ජය ලබා ගත හැකි ය.
(1) මෙය සැමවිට ම සත්‍ය වේ.
(2) මෙය බොහෝ විට සත්‍ය වේ.
(3) මෙය කිසිවිටෙකත් සත්‍ය නො වේ.

● අංක 22 සහ 23 ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍ය දෙකේ අර්ථය අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

22. අජිත්ගේ නිවස පිහිටා ඇත්තේ සිරිමල්ගේ නිවසට නැගෙනහිරිනි. සිරිමල්ගේ නිවස පිහිටා ඇත්තේ නාමල්ගේ නිවසට නැගෙනහිරිනි. එම නිසා
(1) අජිත්ගේ නිවස පිහිටා ඇත්තේ නාමල්ගේ නිවසට නැගෙනහිරිනි.
(2) නාමල්ගේ නිවස අජිත්ගේ නිවස ආසන්නයේ පිහිටා තිබේ.
(3) නාමල්ගේ නිවස සිරිමල්ගේ නිවසට වඩා අජිත්ගේ නිවසට ළඟ ය.

23. සුළඟ හමා ආවොත් උෂ්ණත්ව ගතිය අඩු වේ. සුළං හමා ආවේ නැත. එම නිසා
(1) උෂ්ණත්ව ගතිය වැඩි වේ.
(2) උෂ්ණත්ව ගතිය අඩු වේ.
(3) උෂ්ණත්ව ගතිය වෙනස් නො වේ.

● අංක 24 සිට 26 තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන ඡේදයෙහි හිස්තැන් පිරවීමට අදාළ වේ. එම එක් එක් හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

සුනිමල් සංගීතයට මහත් ඇල්මක් දක්වයි. එමනිසා දෙමව්පියෝ ඔහු ඒ සඳහා 24. ................

[ (1) පුහුණු කර වීමට (2) උනන්දු කර වීමට (3) යොමු කිරීමට ] සංගීත පන්තියකට යැවූහ.

සුනිමල් ඉතා කැමැත්තෙන් නොවරදවා පන්තියට ගොස් වයලින 25.................... [ (1) ගායනය (2) වාදනය (3) පාලනය ] හොඳින් උගත්තේ ය. ඔහුගේ මව්පියෝ තම පුතා ගැන ඉමහත් 26. .................... [ (1) ප්‍රමෝදයට (2) කණස්සල්ලට (3) කරුණාවට ] පත් වූ හ.

● පහත දැක්වෙන කවි දෙක කියවා. අංක 27 සහ 28 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.


විලේ නෙළුම් මල් පිපිලා
මලේ සුවඳ දස අත ලා
තලේ හමන්නා සිහි ලා
කලේ අපේ සිත් සසලා

සිතේ සතුට වඩමින් නේ
අතේ මලක් දරමින් නේ
පුතේ දෙගුරු සලකන් නේ
නැතේ තුඹට වරදින් නේ

27. 'තලේ හමන්නා සිහිලා' යන යෙදුමෙහි තේරුම කුමක් ද?
(1) හමන සීතල සුළඟ
(2) තළයකින් ගත් සීතල ජලය
(3) මල් සුවඳ සහිත සුළඟ


28. 'නැතේ තුඹට වරදින්නේ' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
(1) දෙමව්පියන් තුඹට වරදක් කරන්නේ නැත.
(2) තුඹට කිසි දිනක වැරදීමක් සිදුවන්නේ නැත.
(3) තුඹගේ ජීවිතය සැපවත් වන්නේ ය.


[ 6 වැනි පිටුව බලන්න.

**29.** ඉහළ සිට බැලූ විට  ලෙස පෙනෙන්නේ පහත ඇති කුමන වස්තු යුගලය ද?



(1) (2) (3)

**30.** ඉහළ සිට බැලූ විට  ලෙස පෙනෙන්නේ පහත ඇති කුමන වස්තු යුගලය ද?



(1) (2) (3)

- **අංක 31 සහ 32 ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා මේ රූප හා ඒවායින් කියැවෙන දේ යොදා ගන්න.**




පිරිමි ළමයා   ගැහැනු ළමයා   උදයේ   පාසල   වෙත




ගෙදර   සතුටින්   යයි   එයි   ආපසු

**31.** මේ රූප පෙළින් කියැවෙන්නේ කුමක් ද?



(1) ගැහැනු ළමයා පාසල වෙත උදයේ යන්නේ සතුටිනි.
(2) ගැහැනු ළමයා උදයේ පාසල වෙත යයි.
(3) ගැහැනු ළමයා උදයේ පාසල වෙත සතුටින් යයි.


**32.** මේ රූප පෙළින් කියැවෙන්නේ කුමක් ද?



(1) පිරිමි ළමයා ආපසු ගෙදර වෙත එයි.
(2) පිරිමි ළමයා ගෙදර ආපසු එයි.
(3) පිරිමි ළමයා ගෙදර වෙත සතුටින් ආපසු එයි.

[ 7 වැනි පිටුව බලන්න.

33. ගඩොල් යොදාගෙන සකස් කළ බිත්තියක කොටසක් මෙහි දැක්වේ. ඒ සඳහා යොදා ගෙන ඇති ගඩොල් සංඛ්‍යාව කීයක් විය හැකි ද?



(1) 10 (2) 12 (3) 15

- පහත දැක්වෙන සම්බන්ධතාවල එක් එක් රූපයට අගයක් බැගින් තිබේ. ඒ අනුව අංක 34 සහ 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| ● | + | ▲ | = | **8** |
| ▲ | − | ● | = | **4** |
| ◆ | + | ● | = | **5** |

34. ▲ + ◆ හි අගය කීය ද? .........

35. ▲ × ● හි අගය කීය ද? .........

- අංක 36 සහ 37 ප්‍රශ්න සඳහා දී ඇති අකුරු පේළිවල, යහ ගුණයක් දැක්වෙන ප්‍රකාශයක් බැගින් සඟවා තිබේ. එම ප්‍රකාශවල අකුරු අතරට එක් කර ඇති නොගැළපෙන අකුරු ඉවත් කළ විට ලැබෙන අර්ථවත් ප්‍රකාශ තිත් ඉර මත ලියන්න.

36. අපි ත් බො ද රු ව නො ට කි ර ය ව මු ල

.............................................................................................................

37. අපි වැ ල ඩි ග හි ස ටි මි ය ද ල න් ප ට ර ස ල ක ට ක ර මු ස

.............................................................................................................

[ 8 වැනි පිටුව බලන්න.

- පහත ජාලයෙහි දැක්වෙන තොරතුරු බලන්න. ඒ අනුව අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අක්ෂර හා අංක සහිත ජාලය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | 3 | 3 | 2 | B | 6 | C | D |
| 4 | 1 | A | F | E | 4 | E | F |
| D | F | 3 | 4 | D | 7 | A | E |
| C | 4 | 5 | D | 1 | B | 4 | 1 |
| 3 | F | D | E | F | 1 | C | A |

38. ජාලයෙහි **A** අකුරු **4** ක් තිබේ නම්, ජාලය තුළ ඇති **6** ඉලක්කම වටේ රවුමක් අඳින්න. එසේ නොවේ නම්, ජාලය තුළ ඇති **2** ඉලක්කම යටින් ඉරක් අඳින්න.

39 ජාලයෙහි **D** හා **F** අකුරු **5** බැගින් තිබේ නම්, ජාලය තුළ ඇති **7** ඉලක්කම යටින් ඉරක් අඳින්න. **4** බැගින් තිබේ නම්, ජාලයේ මුලින් ම ඇති **A** අකුර වටේ රවුමක් අඳින්න.

40 ජාලයෙහි **1, 3, 4** යන ඉලක්කම් **4** බැගින් තිබේ නම්, **5** ඉලක්කම වටේ රවුමක් අඳින්න. එසේ නොවේ නම්, **5** ඉලක්කම මත × ලකුණු කරන්න.

❊ ❊ ❊

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

Department of Examinations, Sri Lanka

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2007

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2007 අගෝස්තු

# II පත්‍රය

පැය 1 මිනිත්තු 15 යි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

* ඔබේ විභාග අංකය පහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
* තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.

විභාග අංකය ....................................

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 59 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසි දෙකක් සපයනු ලැබේ.

[ 2 වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන කොටස කියවන්න.

"මල් රෙද්දක් මෙන් පායා තිබූ තරුකැට හැරෙන්නට අහසේ දක්නට ලැබුණේ පූර්ණ චන්ද්‍රයා පමණි. ඈත දියඹට වැටුණු සඳකිරණින් සාගරය බැබළෙන්නට විය. ගොඩබිමට ආසන්න ව පිහිටි ගල්කුළු මඟ හරවමින් නෞකාව පදවනු ලැබූ බැවින්, මදක් වක් මගක් ඔස්සේ එය ගමන් කළේ ය."

- මෙම කොටස ඇසුරෙන් අංක **1** සිට **6** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** ඉහත විස්තරයෙන් කියැවෙන්නේ දවසේ කුමන කාලයක් ද? ..............................

**2.** මෙහි ඇතුළත් උපමාව ලියන්න. ..............................

**3.** **"ඈත"** යන්නෙහි විරුද්ධාර්ථ පදය ලියන්න. ..............................

**4.** **"සාගරය"** යන්නට සමානාර්ථ පදයක් ලියන්න. ..............................

**5.** නෞකාව පදවන ලද්දේ කුමක් මඟ හරවමින් ද? ..............................

**6.** **"එය ගමන් කළේ ය."** මෙහි "එය" යන්න බහුවචනයට හැර වූ විට වාක්‍යය ලිවිය යුත්තේ කෙසේ ද? ..............................

- අංක **7** සහ **8** ප්‍රශ්නවල සඳහන් එක් එක් **යෙදුමේ අදහස** ලියන්න.

**7.** පනින්න පෙර සිතා බලනු :

..............................................................................................

**8.** වක්කඩේ හකුරු හැංගුවා වගේ :

..............................................................................................

**9.** කොටුව තුළ ඇති අකුරුවලින් **සුදුසු අකුර** බැගින් තෝරා වචන සම්පූර්ණ කරන්න.

| ත | ණ | ල | ළ |
|---|---|---|---|

(i) අ ___ සයා (ii) ගු ___ වත් (iii) බැ ___ ලිය (iv) ත ___ තුර

**10.** පහත සඳහන් වාක්‍යය **ස්ත්‍රී ලිංගයට** හරවා ලියන්න.

කුරුල්ලා නාද කළේ ය. ..............................................................................................

**11.** සුදුසු **විරාම ලකුණු** යොදන්න.

| ඔබට ජයවේවා |
|---|

**12.** පහත සඳහන් අදහසට ගැළපෙන **තනි වචනයක්** ලියන්න.

| කිසිවකුට හිරිහැරයක් නොකරන |
|---|

..............................

**13.** වචන ගළපා **අර්ථවත් වැකියක්** ලියන්න.

| නිර්මාණයක් | සැලකෙයි | සොබාදහමේ | ලෙස | අපූර්ව | ලෝකාන්තය |
|---|---|---|---|---|---|

..............................................................................................

..............................................................................................

[ 3 වැනි පිටුව බලන්න.

14. හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.



(i) This is my ..............................

(ii) "කිරළා"ට ඉංග්‍රීසියෙන් කියන වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න ..............................

15. පහත සඳහන් ඉංග්‍රීසි වාක්‍යයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

I am hungry. : ..............................

16. පහත සඳහන් වාක්‍යයෙහි අර්ථය **ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසියෙන්** ලියන්න.

ඔබගේ නම කුමක් ද? ..............................

17. **අර්ථය සිංහලෙන්** ලියන්න.

ඉංගේ වාරුංගළ් : ..............................

18. "කිරි බොන්න" යන වගන්තිය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

..............................

- අංක **19** සිට **40** තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට **යටින් ඉරක් අඳින්න**.

19. පහත දැක්වෙන මල් වර්ග අතුරෙන් වඩාත් ම සුවඳ හමන මල් වර්ගය වන්නේ,
(1) ඉද්ද ය. (2) වතුසුද්ද ය. (3) පිච්ච ය. (4) කටරොළු ය.

20. සියඹලා ශාකයේ පත්‍රවල හැඩයට සමාන හැඩයක් සහිත ශාක පත්‍ර ඇති ශාකය වන්නේ
(1) කතුරු මුරුංගා ය. (2) ගොටුකොළ ය.
(3) මුගුණුවැන්න ය. (4) නිදිකුම්බා ය.

21. කඳෙහි ගෙඩි හටගන්නා ශාකයක් වන්නේ,
(1) බිලිං ය. (2) ලොවි ය. (3) දෙහි ය. (4) මැංගුස් ය.

22. මල්වලට හානි කරන සතකු වන්නේ,
(1) මෙරුවා ය. (2) මීමැස්සා ය. (3) බඹරා ය. (4) කුරුමිණියා ය.

23. පහත දැක්වෙන දේ අතරින් ප්‍රෝටීන් බහුල ව ඇති දෙය වන්නේ,
(1) කැරට් ය. (2) පරිප්පු ය. (3) පලා ය. (4) තිවිති ය.

24. වෛද්‍යවරයකු විසින් රෝගියකුට නියම කරන ලද බෙහෙතක් පානය කිරීමට පෙර, සලකා බැලිය යුතු වඩාත් ම වැදගත් කරුණ වන්නේ,
(1) බෙහෙතෙහි අඩංගු කර ඇති දේ ය. (2) බෙහෙත නිෂ්පාදනය කරන ලද රට ය.
(3) වේලකට ගත යුතු ප්‍රමාණය ය. (4) බෙහෙතෙහි මිල ගණන් ය.

25. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ඉන්දියාවට
(1) උතුරින් ය. (2) දකුණින් ය. (3) බටහිරින් ය. (4) නැගෙනහිරින් ය.

26. ඇඳුමක තැවරුණු තාර පැල්ලමක් ඉවත් කිරීමට භාවිත කළ හැකි වඩාත් ම සුදුසු දේ වන්නේ,
(1) භූමිතෙල් ය. (2) පොල්තෙල් ය. (3) දෙහි ඉස්ම ය. (4) විනාකිරි ය.

[ 4 වැනි පිටුව බලන්න



4-CM 30968


**27.** කහපාට පසුබිමක දැක්වෙන මෙම මාර්ග සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



(1) ඉදිරියෙන් නවතිනු.
(2) ගේට්ටුව සහිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි.
(3) ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි.
(4) මාර්ගය ඉදිරියෙන් වසා ඇත.


**28.** බල්ලකු සපා කෑ අවස්ථාවක දී ප්‍රථමයෙන් ම කළ යුතු වන්නේ,
(1) සපා කෑ ස්ථානය, රෙදිපටියකින් ගැට ගැසීම ය.
(2) සපා කෑ ස්ථානය, සබන් ගා පිරිසිදු ජලයෙන් සේදීම ය.
(3) සපා කෑ ස්ථානය මත බෙහෙත් ගැල්වීම ය.
(4) රෝගියා වෛද්‍යවරයකු වෙත ගෙන යාම ය.

**29.** සිදුරු කැමරාවක් තුළින් ඇත ගොඩනැගිල්ලක් දෙස බැලීමේ දී එය දිස්වන ආකාරය වන්නේ,



(1) (2) (3) (4)

**30.** ඊයේ රාත්‍රී අහසේ පායා තිබුණේ පූර්ණ චන්ද්‍රයා නම් සතියකට පසු අහසේ දක්නට ලැබෙන චන්ද්‍රයාගේ හැඩය දැක්වෙන රූප සටහන වන්නේ,



(1) (2) (3) (4)

**31.** ශ්‍රී ලාංකික පුරවැසියකු පදිංචිය තහවුරු කර ගැනීම සඳහා සහතිකයක් ලබා ගැනීමට පළමුව යා යුත්තේ,
(1) පොලිස් ස්ථානය වෙත ය.
(2) ග්‍රාම නිලධාරී වෙත ය.
(3) සාමදාන විනිශ්චයකාරවරයකු වෙත ය.
(4) ප්‍රාදේශීය ලේකම් වෙත ය.


**32.** ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් නාය යෑමට ගොදුරු වී ඇත. එම ප්‍රදේශයෙන් ඉක්මනින් ඉවත් වන ලෙස ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා වඩාත් ම සුදුසු මාධ්‍යය වන්නේ,
(1) ශබ්දවිකාශන යන්ත්‍රයයි.
(2) දුරකථනයයි.
(3) රූපවාහිනියයි.
(4) ගුවන් විදුලියයි.

**33.** අයඩින්කරණය කරන ලද ලුණු පැකට්ටුවක පහත සඳහන් සංකේතය දක්වා ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ කුමක් ද?



(1) තෙතමනය ඇති තැනක නොතබන්න.
(2) නළ ජලය යොදාගැනීමෙන් වළකින්න.
(3) නොසෝදා පාවිච්චි කරන්න.
(4) උණුවතුරෙන් පමණක් සෝදන්න.

**34.** මැහුම් ක්‍රම අතුරෙන් පිස්මේන්තු මැස්ම දැක්වෙන රූපය කුමක් ද?





(1) (2) (3) (4)


35. ගලගණ්ඩය රෝගයට ප්‍රධාන හේතුවක් වන්නේ,
(1) අයඩීන් ඌනතාවයි.
(2) යකඩ ඌනතාවයි.
(3) විටමින් ඌනතාවයි.
(4) කැල්සියම් ඌනතාවයි.


36. හිරු එළිය හොඳින් වැටෙන ස්ථානයක ගසක අත්තක් පරීක්ෂණයක් සඳහා පොලිතින් බෑගයකින් ආවරණය කර ගැට ගසා තබන ලදී. පැයකට පමණ පසු නිරීක්ෂණය කළ විට දක්නට ලැබුණේ
(1) පත්‍ර මැලවී ඇති බව ය.
(2) පත්‍ර යන්තමින් කහ පැහැ ගැන්වී ඇති බව ය.
(3) බෑගය ඇතුළත කුඩා ජල බිංදු තැන්පත් වී ඇති බව ය.
(4) බෑගයේ ඇතුළත හා පිටත ජල බිංදු තැන්පත් වී ඇති බව ය.

37. උත්සව අවස්ථාවල දී මඟුල් බෙර වාදනය සමඟ භාවිත කෙරෙන තවත් භාණ්ඩයක් වන්නේ


(1)


(2)


(3)



(4)

38. පොලිතින් සම්බන්ධ ව පහත ලියා ඇති වගන්තිවලින් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පොලිතින් පිළිස්සීමෙන් පිටවන විෂ වායු ලෙඩරෝගවලට තුඩුදෙයි.
(2) පොලිතින් දිරාපත්වීම ඉක්මනින් සිදු වන නිසා පස සරු වෙයි.
(3) පොලිතින් කැබැලි කානුවල හිරවීම නිසා ජලය ගලා යාමට බාධක ඇති වේ.
(4) ඉවතලන ආහාර සහිත පොලිතින් කෑමෙන් සත්තු මිය යති.

39. මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්න ව පිහිටා ඇති නගරය වන්නේ,
(1) කැලණිය ය. (2) කළුතර ය. (3) ගාල්ල ය. (4) ත්‍රිකුණාමලය ය.


40. සාමයේ සංකේතය සේ සලකනු ලබන්නේ,
(1) සුදුහංසයා ය. (2) සුදුපරෙවියා ය. (3) සුදුකොකා ය. (4) සැළලිහිණියා ය.


● විවිධ කාර්ය සඳහා යොදා ගනු ලබන උපකරණ කිහිපයක් මෙහි දැක්වේ.


(1)


(2)


(3)


(4)


(5)

පහත දැක්වෙන එක් එක් කාර්යය කර ගැනීමට වඩාත් ම සුදුසු උපකරණයේ අංකය තිත් ඉර මත ලියන්න.

41. පරාලයක් පසාරු කරගෙන යන සිදුරක් විදීමට ...............

42. ලී කොටයකින් රූපයක් නෙළීමට ............

[ 6 වැනි පිටුව බලන්න.

● ශ්‍රී ලංකාවේ කලා කෘති දෙකක පින්තූර පහත දැක්වේ. ඒවා නම් කරන්න.






43. ....................................... 44. .......................................


45. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ක්‍රීඩා දෙකක පින්තූර පහත දක්වේ. එම ක්‍රීඩා නම් කරන්න.






(i) ....................................... (ii) .......................................

46. වියළි කෝෂ දෙකක් සහ විදුලි බුබුලක් රූපයේ පෙන්වා ඇත. වයර් කැබැලි තුනක් පමණක් යොදා ගෙන බල්බය දැල්වීමට, වියළි කෝෂ හා බල්බය සම්බන්ධ කළ යුතු ආකාරය අඳින්න.




47. කණ්ඩායමක සිසුන්ගෙන්, ඔවුන් වඩාත් ම කැමැති පලතුරු වර්ගය විමසා, තොරතුරු සටහන් කර ගන්නා ලදී. පලතුරු වර්ග හතරකට කැමැති සිසු සංඛ්‍යා දැක්වෙන ප්‍රස්තාරය පහත දී ඇත.




(i) අඹවලට කැමැති සිසුන් සංඛ්‍යාව කීය ද? .......................


(ii) පේරවලට කැමැති සිසුන් සංඛ්‍යාවට වඩා කොපමණ සිසුන් සංඛ්‍යාවක් පැපොල්වලට කැමැති ද? .......................

(iii) අන්නාසිවලට කැමැති සිසුන් සංඛ්‍යාව 35 ක් විය. එය ප්‍රස්තාරයේ අදාළ තීරයේ ලකුණු කර අඳුරු කරන්න.

(iv) මෙම පලතුරු වර්ග පහට කැමැති මුළු සිසුන් සංඛ්‍යාව කීය ද? .......................


[ 7 වැනි පිටුව බලන්න.

**48.** ගොඩනැගිලි සැලැස්මක් පහත රූපයේ දැක්වේ.




පෙන්වා ඇති පරිමාණයට අනුව B කාමරයේ දිග කීය ද? ........................ m

**49.** රූපයේ පෙන්වා ඇති සමචතුරස්‍රයේ සමමිතික රේඛා **දෙකක්** අඳින්න.



**50.** නගර කිහිපයක් අතර දුර කිලෝමීටරවලින් පහත සටහනේ දැක්වේ.

| | | | පුත්තලම |
|---|---|---|---|
| කොළඹ | | | 142 |
| ගාල්ල | | 116 | 258 |
| මාතර | 45 | 161 | |

මාතර සිට ගාල්ල හා කොළඹ හරහා පුත්තලමට දුර කොපමණ ද? ..................km

**51.** රුපියල් 25.00 ක චිත්‍ර පොතක් සහ රුපියල් 15.50 ක පාට පෙට්ටියක් මිලට ගෙන රුපියල් සියයේ නෝට්ටුවක් දුන් විට ලැබිය යුතු ඉතුරු මුදල කීය ද?

රුපියල් ............... සත...............


**52.** නිමල්ගේ මවගේ බර, නිමල්ගේ බර මෙන් දෙගුණයකි. මවගේ බර 55 kg 500 g ක් වේ නම් නිමල්ගේ බර කොපමණ ද?

............kg ............g

**53.** ධාරිතාව 750 ml බැගින් වූ බෝතල් හයක පැණි බීම වෙනත් භාජනයකට වත්කරන ලදී. භාජනයේ ඇති පැණි බීම මුළු පරිමාව ලීටර සහ මිලිලීටරවලින් කොපමණ ද?

........... l ...........ml

**54.** A ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව B ඔරලෝසු මුහුණතේ දැක්වීමට, එහි පැය කටුව හා මිනිත්තු කටුව අඳින්න.





A B

**55.** කාමරයක බිත්තිවල ගෑම සඳහා තීන්ත ලීටර 3 ක් අවශ්‍ය විය. තීන්ත මිල දී ගත්තේ ලීටර බාගයේ ටින් ලෙස ය. ටින් එකක මිල රුපියල් 350 කි. තීන්ත සඳහා වැය වූ මුදල කීය ද?

රුපියල් .....................

**56.** රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් සේ ලියන්න.




.....................

**57.** පැන්සල් 650 ක්, එක් අයකුට 6 බැගින් කී දෙනකුට බෙදා දිය හැකි ද? ……………………

එවිට කීයක් ඉතුරු වේ ද? ……………………

**58.** දී ඇති මිනුම් අනුව මෙම රූපයේ පරිමිතිය සොයන්න.




……………………m

**59.** සිසුවකු විසින් ලිවීමට ආරම්භ කරන ලද රචනයක මුල් කොටස පහත දැක්වේ. සිසුවා නතර කළ තැන සිට ඉතුරු කොටස සම්පූර්ණ කිරීමට නිර්මාණාත්මක වැකි හයක් ලියන්න.

"මාස කිහිපයකින් ම පොළෝ තලය මතට පොද වැස්සක්වත් නොලැබුණි. දැඩි උණුසුම නිසා පොළොව ඉරි තැලිණි. ගංගා, ඇළ, දොළ, ළිං, පොකුණු සිඳී ගියේ ය. ඇසට පෙනෙන මානයක කොළ පැහැයක් දක්නට නොවී ය.

වාසනාවකි ! අහස ගුගුරුවා එක් වර ම මහ වැස්සක් ඇදහැලෙන්නට පටන්ගත්තේ ය. . . . . . . . . . . .

(එක් එක් වාක්‍යයක වචන හතරක්වත් ඇතුළත් විය යුතු ය. එම වාක්‍යවල උක්ත, ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.)

(i) ……………………………………………………………………………………

……………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………

……………………………………………………………………………………

(iii) ……………………………………………………………………………………

……………………………………………………………………………………

(iv) ……………………………………………………………………………………

……………………………………………………………………………………

(v) ……………………………………………………………………………………

……………………………………………………………………………………

(vi) ……………………………………………………………………………………

……………………………………………………………………………………

***